DreamMakers Foundation

# Introduction

# හැඳින්වීම

## KidFinance Program

### අන්තර්ගතය පැහැදිලි කිරීමකි

KidFinance

The Ladder of success

www.dreammakers.lk/kidfinance

# Table of Contents - KidsMoney Experts

## පෙළගැස්ම


| | පිටු අංකය |
|---|---|
| වැඩසටහන පිලිබඳ.. | 2 |
| හැඳින්වීම | 4 |
| 1. මූල්‍ය සාක්ෂරතාව සහ සාර්ථකත්වය | 11 |
| 2. මුදල් අවබෝධ කර ගනිමු.. | 14 |
| 3. මුදල් ඉපයීම | 20 |
| 4. ව්‍යවසායකත්වයේ බලය | 25 |
| 5. මුදල් කළමනාකරණය | 29 |
| 6. මුදල් ඉතිරි කිරීම | 37 |
| 7. මුදල් වියදම් කිරීම | 48 |
| 8. මුදල් වර්ධනය කිරීම | 64 |
| 9. සංයුක්ත පොලියේ වටිනාකම | 76 |
| 10. වත්කම් සහ වගකීම් අවබෝධ කර ගැනීම | 81 |
| 11. බදු පිලිබඳ අවබෝධය | 86 |
| 12. ආපසු දීමේ බලය | 89 |
| 13. ජීවිතය ජය ලබන මුදල් පුරුදු | 96 |




# Table of Contents - KidsEntreprenurs

## පෙළගැස්ම

පිටු අංකය


| | |
|---|---|
| වැඩසටහන පිළිබඳ.. | 2 |
| හැඳින්වීම | 4 |
| 1.කවුද මේ ව්‍යවසායකයා ??? | 7 |
| 2.සුන්දර ව්‍යවසායකත්වය | 13 |
| 3. ආරම්භ කරමු ! | 21 |
| 4. ඔබේ පුංචි ව්‍යාපාරය ලෝකෙට පෙන්නමු ! | 29 |
| 5. සැබෑ ලෝකයේ ව්‍යවසායකත්වය | 33 |
| 6.අපි විකුනන්නේ කීයටද ? | 37 |
| 7.පාරිභෝගිකයින් සොයා යමු | 41 |
| 8.සැලසුම් කරමු ඔබේ ව්‍යාපාරය | 44 |
| 9. අන්තර්ජාල භාවිතය | 46 |
| 10. මාකටින් ඉගෙන ගන්න | 51 |
| 11. අලෙවි කිරීම යනු කලාවක් | 57 |
| 12.ජාලකරණය | 62 |
| 13. ව්‍යාපාරය වර්ධනය කරමු ! | 65 |




www.dreammakers.lk

Personal Use Only. Distribution Prohibited

14 අභියෝග ජය ගැනීම 70

15 ප්‍රගතිය සහ සාර්ථකත්වය මැන බැලීම 75

16 මූලික නීතිමය සහ සදාචාරාත්මක සලකා බැලීම් 80

17. අනාගතය සඳහා සැලසුම් කිරීම‍්‍ර ! 84

18 ආපසු දීමේ බලය 90

19 ඔබේ ව්‍යවසායක ගමන දැන් ආරම්භ වේ.. 94

20 නැවත මෙනෙහි කරමු 98




"ඔබේ වියදම් පාලනය කරන්න, නැතිනම් ඔබේ වියදම් ඔබව පාලනය කරයි. ඔබ ඔබේ මුදල් පාලනය කරන්න. නැති නම් මුදල් විසින් ඔබව පාලනයට ගනු ඇත"

Read Some Sample Pages
පිටු කිහිපයක් කියවමු
www.dreammakers.lk

## මුදල් පිලිබඳ තේරුම් ගැනීම සුපිරි බලයක් !

ඔව් මේක ඇත්තක් ! මොකද ඒ හරහා ඔබට මුදල් ඉපයීමේ අවස්ථා නිර්මාණය කර ගන්න පුළුවන්. ඒ හරහා ඔබේ හීන හැබෑ කරගන්න පුළුවන්. ඒ වගේම සාර්ථක පුද්ගලයෙක් වෙලා අන් අයට ද උපකාර කරන්න පුළුවන් .ජීවිත කාලෙම සල්ලි ගැන වද නොවී සතුටින් ජීවත් වෙන්න පුළුවන්...

## ඇයි මේ පොත බලවත් ???

ඔව් අපි දන්නවා ඔබ ඒ ගැන සිතන බව. හොදයි.. මෙම පොත ඔබට මූල්‍ය සාක්ෂරතාව තුල ඇති මූලික කරුණු පමණක් නොව පාසල් අවධිය තුලම ඔබව ව්‍යවසායකයෙකු කිරීමේ කාර්යය තුල - ව්‍යාපාරිකයෙක් ලෙස මුදල් හසුරවන්නේ කෙසේද යන්නත් පැහැදිලි කර දෙනවා. ඉතින් ගොඩක් වටිනවා නේද ? එහෙම තමයි.. "ඩ්‍රීම්මේකර්ස්" කියන්නේ ඒ වගේ අමුතු - ලස්සන වැඩ කරන තැනක්. අපිට පුළුවන් එකතු වෙලා මේ රට වගේම ලෝකයත් ලස්සන තැනක් කරන්න.

## මුදල් කියන්නේ හැම දෙයක්මද ?

මුදල් කියන්නේ අනිත් හැම දෙකටම වඩා වටිනා දේ බව නෙවෙයි අපි මේ කියන්න හදන්නේ.. අපි කියන්නේ මුදල් ගැන අවබෝධයෙන් වැඩ කිරීම නිසැකවම ඔබේ සාර්ථකත්වයට යතුර බවයි. ඇත්ත.. මුදල් වලට වඩා වටිනා ගොඩක් දේවල් තියනවා වගේම ඒ දේවල් මුදල් වියදම් කරලා ගන්නත් බෑ. ආදරය , කරුණාව , සමාව දීම , නිරෝගී බව , මානසික නිදහස , සුන්දර මිනිසෙක් වෙන එක වගේ දේවල් ඒ අතර ඉහලින් තියනවා. ඉතින් මුදල් කියන්නේ හැමදේම නෙවෙයි. වරදවා තේරුම් ගන්න එපා. මූල්‍ය සාක්ෂරතාවය කියන්නේ සංඛ්‍යා පමණක් නොවේ. එය ඔබ ආඩම්බර වන ජීවිතයක් නිර්මාණය කිරීම ගැනයි. දරුවනේ මතක තබා ගන්න. සෑම විශාල ජයග්‍රහණයක්ම කුඩා පියවර තුලින් තමයි ආරම්භ වෙන්නේ. ඔබත් පෙරළිකාර ජීවිතයක් ගත කිරීමට සිහින දකින දරුවෙකු නම් - මෙය ඔබට සැබෑ ආශිර්වාදයක් වනු ඇත. ඔබ ජීවිතයේ ඉලක්කයන් වෙත ලඟා වීමට සිහින දකින දරුවෙකු නම්, මේ ඔබේ මාර්ගෝපදේශකයා වනු ඇත. අද ඔබ ලබා ගන්නා මෙම විශිෂ්ඨ දැනුම ඔබේ හෙට දවසේ බුද්ධිමත් තීරණ ගැනීමට ඔබට බෙහෙවින් උපකාරී වනු නොඅනුමානය.



Personal Use Only. Distribution Prohibited

## ඉතින් අපි තේරුම් ගනිමු..

දරුවනි..! සාර්ථකත්වයේ මාවත ආරම්භ වන්නේ අප ක්‍රියාත්මක වීමෙන් පමණයි. එබැවින් ඔබට ඉගෙනීමට ඇති සෑම අවස්ථාවක්ම ලබා ගන්න. වැරදි කිරීමට බිය නොවන්න. ඔබේ ඉලක්ක කෙරෙහි පූර්ණ අවධානය යොමු කරන්න. නිවැරදි මානසිකත්වය තුල ජීවත් වන්න. වෙහෙස මහන්සි වී වැඩ කිරීම සහ නොපසුබට උත්සාහය තමයි ඔයාව ධනවතෙකු බවට පත් කරන්නේ. ඔබට ඔබේ මුදල් වර්ධනය කර ගැනීමට අවශ්‍යද ? ඔබේ සිහින සැබෑ කර ගැනීමට සහ ඔබට දීප්තිමත් අනාගතයක් නිර්මාණය කර ගැනීමට අවශ්‍යද ? අපි යමු පාඩම් දෙසට..

## පිළිතුරු ලියමු

01. ඔබේ පවුලට මුදල් ලැබෙන ආකාර මොනවාද ?

.............................. .............................. ...............................

02. ඔබ වෙනුවෙන් දෙමාපියන් මාසිකව කොපමණ වියදමක් දරනවාද ?

......................................

03. මුදල් නොමැතිව ඔබට සතුටු විය හැකි ආකාර මොනවාද?

.............................. .............................. ...............................

04. ඔබ මිලදී ගැනීමට සිහින මවන දෙයක් වේ නම් ඒ කුමක්ද ?

..............................................................................................

05. ඔබේ අනාගත සිහිනය කුමක්ද ?

..............................................................................................



Personal Use Only. Distribution Prohibitted

## ඒ නිසා අප තේරුම් ගත යුතුයි..

**දෙයක් වෙන කෙනෙක්ගෙන් අරන් විකුණලා මුදල් උපයන එක ව්‍යාපාරයක්. නමුත් මිනිස්සුන්ගේ ප්‍රශ්න වලට විසඳුම් දෙන නිර්මාණයන් තුලින් ලෝකය වෙනස් කිරීම තමයි මේ - 'ව්‍යවසායකත්වය'.**

ව්‍යවසායකයින් අලුත් දේ අත්හදා බැලීමට උත්සාහ කරති. මීට පෙර නොතිබුණු දෙයක් ලෝකයට ලබා දීමට ඔවුන් නිතරම තම මනස මෙහෙයවති.

Personal Use Only. Distribution Prohibitted

## මනසට ක්‍රියාකාරකම්

01. ව්‍යවසායකයෙකු යනු සැබවින්ම කවුරුන්ද ?

..........................................................................................................

..........................................................................................................

02. කුඩා ළමුන්ටත් ව්‍යසායකයන් වීමට හැකිද ?

......................................

03.ව්‍යවසායකයෙකු හට නිර්මාණශීලීත්වය අවශ්‍ය වන්නේ ඇයි ?

..........................................................................................................

04. ව්‍යවසායකයෙකුට සාර්ථක වීමට අවශ්‍ය කුසලතා 3ක් ලියන්න.

.................................. .................................... ...............................

05. ගැටළු විසඳමින් මිනිසුන්ගේ අනාගත අවශ්‍යතා හඳුනා ගන්නේ..,

රැකියාවක නිරත වෙන්නා ව්‍යාපාරිකයා ව්‍යවසායකයා

06. ඔබ දන්නා සාර්ථක වූ කුඩා ව්‍යවසායකයෙකු නම් කරන්න.

......................................

## මුදල් සඳහා වටිනාකමක් ඇත්තේ ඇයි?

මුදල්වලට වටිනාකමක් ඇත්තේ මිනිසුන් එය දේවල් මිලදී ගැනීමට භාවිතා කළ හැකි බව විශ්වාස කරන බැවිනි. රසකැවිලි වෙනුවට සෙල්ලම් බඩු හුවමාරු කරනවා වෙනුවට, අපි මුදල් භාවිතා කරන්නේ එය පහසු මෙන්ම සාධාරණ නිසා ය. ඔබට පසුව වෙනත් යමක් මිලදී ගැනීමට එය ඉතිරි කර ගත හැකි නිසා ද මුදල් ප්‍රයෝජනවත් වේ. එහි වටිනාකම ඇතිවන්නේ දේවල් සඳහා ගෙවීමට මුදල් භාවිතා කළ හැකි බවට සියලු දෙනා එකඟ වීමෙනි. මුදල් හරහා ජීවිතය සරල කිරීමට සහ සෑම වෙළඳාම පහසු කිරීම සිදුවේ.

කාලයත් සමඟ මිල ගණන් ඉහළ යාම හෙවත් උද්ධමනය සඳහා ද මුදල් බලපායි. මුදල් ඉතිරි කිරීම වැදගත් වන්නේ එබැවිනි. නමුත් ඉතිරි කිරීමෙන් මෙරට උද්ධමනයට මුහුණ දීම තරමක් අපහසුය. නමුත් නිසි ආයෝජන අවස්ථා හඳුනාගෙන ඒ වෙත මුදල් යෙදවීමෙන් ඊට සාර්ථකව මුහුණ දිය හැකිය.

## කෝටිපති පාසලේ විදුහල්පති

මුල්‍ය සාක්ෂරතාව ගත් කල රොබට් කියෝසකි නම් විශිෂ්ඨ කතුවරයා අමතක කල නොහැකිය. ඔහු පැහැදිලි කර දෙන්නේ මුල්‍ය අධ්‍යාපනය නොමැති වීමෙන් මුදල් කළමනාකරණය කර ගැනීමට මිනිසුන් අපොහොසත් වන බවත් ඒ හේතුකොටගෙන මිනිසුන් වියදම් කිරීමේ චක්‍රයක සිරවී සිටින බවත්ය.



විශේෂයෙන් සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය බොහෝ විට මුදල් කළමනාකරණය නොසලකා හරින බැවින් ජීවිතයේ සාර්ථකත්වය ළඟා කර ගැනීම සඳහා මූල්‍ය දැනුම කෙසේ හෝ ලබාගැනීම ඉතා වැදගත් වේ.

**"නිසි මූල්‍ය බුද්ධියෙන් තොර මුදල් බොහෝ ඉක්මනින් ඔබෙන් ගිලිහී යයි."**

Personal Use Only. Distribution Prohibited

# 01 සිතුවිලි සිතියම් MIND MAPPING

## මනසේ විභවයේ දොරගුළු හැරීමට නිර්මාණාත්මක ක්‍රමයක්

Personal Use Only. Distribution Prohibited

මෙම ශිල්පීය ක්‍රම ප්‍රගුණ කරන ඕනෑම දරුවෙකු - අධ්‍යන කටයුතු මෙන්ම ජීවිතයේ සෑම අංශයකම දියුණුව සඳහා අවශ්‍ය මානසිකත්වය හා කුසලතා ලබා ගනී. නිර්මාණශීලීත්වය , ආත්ම විශ්වාසය , සැලසුම් සකස් කිරීම මෙන්ම සාර්ථක තීරණ ගැනීමට ඔවුන් පියවරෙන් පියවර පුරුදු පුහුණු වේ.

එය ගසක් ලෙස සිතන්න. එහි කඳ කොටස ඔබේ ප්‍රධාන ඉලක්කය වේ. එහි විහිදී ඇති අතු ඔබේ ඉලක්කය සපුරා ගැනීමට ඔබ විසින් යොදා ගනු ලබන අදහස් සහ ක්‍රමෝපායන් වේ. ප්‍රධාන අරමුණ ඉටු කරගැනීමේ සිතියමක් ලෙස මෙය අර්ථ දැක්විය හැකිය. මෙයින් ඔබට ඔබේ සිතුවිලි ජීවමාන කල හැකිය. ට එය දැකිය හැකි වන විට එය සාක්ෂාත් කර ගැනීමේ සම්භාවිතාව ඉහල නැංවේ.

එමෙන්ම එකිනෙකට වෙනස් සංකල්ප - එකම මොහොතේ දැකිය හැකි වන විට ඒවා අනෙකට සම්බන්ධ කරන්නේ කෙසේදැයි ඔබ පහසුවෙන් ඉගෙන ගනු ඇත.

ඔබ තිත් එකින් එක ගලපා ගන්න. ඔබේ අතීත සිදුවීම් සහ නොගැලපේ යයි සිතෙන සිදුවීම් පසුපසට පරීක්ෂා කර බැලීමෙන් ඔබේ අතීතය - අනාගතයට සම්බන්ධ වන්නේ කෙසේදැයි ඔබ ඉගෙන ගනු ඇත.

විශේෂත්වය නම් ළමුන් සඳහා, —මනස සිතියම්කරණය— යනු අදහස් සංවිධානය කිරීම පමණක් නොවේ. එය ඔවුන්ගේ මනස සැරිසැරීමට සලස්වා විවිධ හැකියාවන් ගවේෂණය කිරීමට පුහුණු කරයි. ඔවුන්ගේ එක් අදහසක් ඉවතට ඇද ගැනීමෙන් තවත් සිතුවිල්ලකට මඟ පාදන ආකාරය සහ අසම්බන්ධිත අදහස් එකිනෙකට සම්බන්ධ වන ආකාරය දරුවන්ට හොඳින් දැක ගත හැකිය. මෙම ක්‍රියාවලිය නිර්මාණශීලීත්වය අවදි කරයි. ගැටළු වලට නව්‍ය විසඳුම් ඉදිරිපත් කිරීමට ඔවුන් පෙළෙඹේ. පාසලේ ව්‍යාපෘතියක්, වේදිකාවේ කතාවක් කිරීමට මෙන්ම ගණිත ගැටළුවක් විසඳීම සඳහා ඔවුන් අනෙක් ළමුන්ට වඩා හොඳින් ක්‍රියා කරයි.

## ක්ෂණික තෘප්තිය වෙනුවට සැලසුම් කල ඉලක්ක

විධිමත් රාමුවක් ඔස්සේ මුදල් සම්බන්ධයෙන් කටයුතු කිරීමට පෙළෙඹෙන ළමුන් දිගුකාලීන චින්තනය ඇති කර ගනී. ඔවුන් තමන්ව ක්ෂණිකව තෘප්තිමත් කරන දේවල් වලට වඩා ජීවිතයේ සැබෑ අගයන් අවබෝධ කර ගනී. එමගින් ඔවුන් තමුන්ට සැබවින්ම අවශ්‍ය කරන දේවල් සඳහා සැලසුම් නිර්මාණය කිරීමට පෙළඹේ.

කාලයත් සමඟ ඔවුන් සිහින මවන අකාරයේ අනාගතයක් නිර්මාණය කර ගැනීමට සහ ඊට ගැලපෙන පරිදි තම වියදම් ඇතුළු මූල්‍ය ක්‍රියාකාරකම් පෙළගැස්වීමට ඔවුන් පහත කුසලතා වර්ධය කර ගනී.

- ඉවසීමෙන් මුදල් සමඟ කටයුතු කිරීම
- උපායමාර්ගික චින්තනය
- මූල්‍ය විනය

## ඔවුන් ධනාත්මක මූල්‍ය හැසිරීම් ශක්තිමත් කරයි.

මෙය ඔබේ මාංශපේශි වලට ඇති ස්වභාවික මතකය වැනිය. එනම් ඇතැම් දේ ඔබ සිතන්නටත් පෙර කිරීමට ඊට හැකියාවක් ඇත. මෙම රාමු තුල ඔබ එක එල්ලේ ගමන් කරන විට ඒවාද ඔබේ මාංශ පේශි මතකය මෙන් ස්වභාවික ප්‍රතිචාර දැක්වීමට නිතැතින්ම කටයුතු කරයි. එය ඔබේ හැසිරීම හැඩගස්වයි. ඔබට ලැබෙන සෑම දීමනාවක්ම, තෑග්ගක් මෙන්ම උපයාගත් මුදලක් සමඟද ඔවුන් පහත ආකාරයෙන් සිතන්නට පුරුදු පුහුණු වෙයි.

- මම නිවැරදි තේරීම් කල යුතුයි.
- මම වුවමනා වලට එදිරිව අවශ්‍යතා පිලිබඳ මෙනෙහි කල යුතුයි.
- මම ජීවිතයේ වගකීම් දැරීම පුරුදු විය යුතුයි.

## අනාගත සාර්ථකත්වය සඳහා සැබෑ ජීවිතයේ ප්‍රතිඵල

- ජීවිතයේ පසුකාලීනව අත්විඳීමට බලපාන ණය උගුල් වලින් ඔවුන් සුරැකෙනු ඇත.
- පිරමීඩ වැනි තම මුදල් අහිමි වීමට බලපාන දේ වලින් ඔවුන් සුරැකෙනු ඇත.
- වැඩිහිටි වියේදී ඔවුනට ඉහල ඉතුරුම් අනුපාතයක් පවතිනු ඇත.
- රොබට් කියෝසකි වැනි විශිෂ්ඨයින් පහදා දෙන පරිදි ණය හරහා ධනය ගොඩනගනු ඇත.
- සැබෑ ආයෝජන සහ අයහපත් ආයෝජන අතර වෙනස හඳුනා ගනී.

ඔවුන් තනිවම ඔවුන් විසින් කළමනාකරණය කල මුදල් භාවිතා කරමින් ව්‍යාපාර ආරම්භ කරනවා පමණක් නොව ඒවා නොවැටී පවත්වාගෙන යාමටද සමත් වේ. එමෙන්ම ඔවුන් උසස් අධ්‍යාපනය කරා වේගයෙන් පියමනිනු ඇත. මන්ද ඔවුන් මුදල් කළමනාකරණ කරන බැවින් අන් සියල්ලන්ට වඩා ඔවුන්ට කාලය නම් වටිනා සම්පත වැඩි වැඩියෙන් ලැබෙනු ඇත. එමෙන්ම ඔවුන් වෙනස් වන ආර්ථික පරිසරයන්ට ඉක්මනින් අනුවර්තනය වනු ඇත. මන්ද ඔවුන් අනෙක් අයට වඩා දක්ෂයි..

Personal Use Only. Distribution Prohibitted

# 04:00 W.I.S.E. සිතීම

## THINK W.I.S.E.

නිශ්චිත යමක් සඳහා බුද්ධිමත් ප්‍රවේශයක්

ඔබට යමක් ලබා ගැනීම සඳහා විශාල ආශාවක් ඇතිවූ අවස්ථාවක් මතකයට නගා ගත හැකිද ? එය ඇත්තෙන්ම මිලදී ගත යුතුද.. නැතිනම් ඒ සඳහා යම් කාලයක් ඉවසීමෙන් බලා සිටිය යුතුද යන්න ඔබ සිතා තිබේද? එය ඇතැම් විට අලුත්ම ගැජට් එකක් , දිලිසෙන සපත්තු යුගලක් හෝ වීඩියෝ ක්‍රීඩාවක් විය හැකිය. මේ අතුරින් කුමක් තමන් හට වඩාත් සුදුසුද සහ තමන්ට සැබවින්ම ගැලපෙන දෙය කුමක්ද සිතමින් ඔබ කල් ගෙවන්නට ඇත.

මෙවැනි තත්වයන්හිදී උපක්‍රමශීලීව තීරණ පහසු කිරීමට සරල හා බුද්ධිමත් ක්‍රමයක් ඇති අතර එය වයිස් රාමුව ලෙස හැඳින්වේ. මෙය අප ව්‍යවසායකත්වය කොටසේදී ද කතා කල නමුත් ඊට අදාළ නොවන තවත් තාක්ෂණික රාමුවකි.

| WANT | INVESTIGATE | SAVE | EXECUTE |
| --- | --- | --- | --- |
| අවශ්‍යතාවයක් ඇතිවීම | විමර්ශනයක යෙදීම | ඒ වෙනුවෙන් ඉතිරි කිරීම | ක්‍රියාත්මක කිරීම |

පියවර 01 අවශ්‍යතාවයක් ඇතිවීම - මට ඇත්තෙන්ම අවශ්‍ය කුමක්ද ?

කුඩා දරුවෙකු වන ඔබට අවශ්‍ය යයි හැගෙන බොහෝ දේ තිබීම සාමාන්‍ය වේ. නමුත් ඒවා අතුරින් තමා පළමුව ලබා ගත යුතු වටිනාම දේ කුමක්දැයි තීරනය කිරීම තරමක් දුරට අපහසු කටයුත්තක් වනු ඇත. එබැවින් ඔබේ අවශ්‍යතා යයි ඔබට හිතෙන දේවල් ලියා පෙළගැස්වීම පළමුව කල යුතුවේ. ඒවා කඩදාසියක් මත දෘශ්‍යමාන වීම ඔබට වඩා හොඳ තේරීමක් කිරීමට අවස්ථාව ලබා දේ. ඔබේ ආශාව පැහැදිලිව හඳුනා ගැනීම තීරණ ඔබේ මුදල් ඥානවන්තව භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳ බුද්ධිමත් තේරීම් කිරීමට පළමු පියවරයි.

**අරමුණ** = ආවේගශීලි මිලදී ගැනීම් අවම කිරීම සහ එමඟින් පසුව ඇති විය හැකි බලාපොරොත්තු සුන්වීම් වළක්වා ගැනීම.

එමන්ම තමන් තෝරා ගන්නා අයිතමයේ සැබෑ අවශ්‍යතාවය වටහා ගත හැක්කේ එය ඔබට සැබවින්ම ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි යන්න ගැන සිතීමෙනි. 1 වන පියවරේදී මෙම කල්පනාකාරී ප්‍රවේශය ගැනීමෙන්, ඔබ දැන් සහ අනාගතයේදී ආඩම්බර වන තීරණ - එනම් ප්‍ර ඥාවන්ත සහ ඉටු කර ගත හැකි තීරණ ගැනීම සඳහා ඔබව පුරුදු පුහුණු කෙරේ.

Personal Use Only. Distribution Prohibited

## 02 ස්කැම්පර් තාක්ෂණික ක්‍රමය

## SCAMPER TECHNIQUE

### රාමුවෙන් පිටත සිතීමේ ක්‍රමවේදය

**SCAMPER** තාක්‍ෂණය යනු අධ්‍යාපනයේදී හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීමේදී දරුවන්ට ඔවුන්ගේ ගැටළු විසඳීමේ කුසලතා වැඩි දියුණු කිරීමට උපකාරී වන ප්‍රබල නිර්මාණාත්මක චින්තන මෙවලමකි. මෙහි එක් එක් අකුරට අදාළ අරුතක් ඇති අතර පවතින අදහස් වැඩිදියුණු කිරීමට හෝ අලුත් ඒවා නිර්මාණය කිරීමට විවිධ ක්‍රම සොයමින් වෙනස් ලෙස සිතීමට දරුවන් දිරිමත් කරයි.

ආදේශ කිරීම යනු නිෂ්පාදනයක හෝ යම් ක්‍රියාවලියක ගුණාත්මකභාවය අඩු නොකර ප්‍රතිස්ථාපනය කල හි දේ මොනවාදැයි සෙවීමයි. වැඩි ගුණාත්මකභාවයක් ලබා දෙන නමුත් පිරිවැය අඩු කිරීමට කල හැකි දේ සෙවීමයි.

ඒකාබද්ධ කිරීම යනු අලුත් දෙයක් නිර්මාණය කිරීමට හෝ පවතින දෙයක ක්‍රියාකාරීත්වය වැඩි කිරීමට දේවල් එකට එක් කිරීමය. ඔබට නිෂ්පාදන දෙකක් එක්කාසු කරමින් නව නිර්මාණයක් කල හැකිය. එමෙන්ම ඒ හරහා එහි වටිනාකම වැඩි වනු ඇත.

අනුවර්තනය යනු වෙනස් අරමුණක් සඳහා හෝ නව ආකාරයකින් - ක්‍රියාත්මක වන පරිදි අපට යමක් වෙනස් කළ හැකි හෝ සකස් කළ හැකි ආකාරය ගැන සිතීමයි. මෙහෙම හිතන්න.. නගරයක ආහාර බෙදා හැරීමේ සේවාවක් හොඳින් ක්‍රියාත්මක වන ආකාරය ඔබ දුටුවහොත්, ඒ වෙනුවට ඒ ක්‍රමයම යොදා ගනිමින් පොත් හෝ සෙල්ලම් බඩු වැනි වෙනස් දෙයක් සඳහා බෙදා හැරීමේ සේවාවක් නිර්මාණය කිරීම වෙනුවෙන් ඔබට එම අදහස අනුවර්තනය කළ හැකිද?

Personal Use Only. Distribution Prohibited

# බෑග් රාමුව

## WHAT'S IN YOUR B.A.G.? – BUDGET, ACT, GROW

බුද්ධිමත් දරුවන් බුද්ධිමත් අනාගතයක්
ගොඩනගන ආකාරය පිළිබඳ ගැඹුරු බැල්මක්

අද ලෝකයේ බොහෝ දරුවන්ට මුදල් වියදම් කරන ආකාරය පමණක් උගන්වනු ලැබේ. ඇතැමුන්ට ඉතිරි කිරීම කියාදේ. එය වර්ධනය කරගන්නේ කෙසේදැයි සීමිත පිරිසකට කියා දෙනු ලබන අතර මුදල් පිළිබඳ නිසි මානසිකත්වයක් පුහුණු කරන්නේ ඉතා අතලොස්සකටය. නමුත් අද ලෝකයේ, මුදල් සමඟ කළ යුතු දේ දැන ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. මුදල් හැසිරෙන ආකාරය, ඔබේ තේරීම් වැදගත් වන්නේ මන්ද සහ ඔබ මුදල් භාවිතා කරන ආකාරයෙන් ඔබ කවර ආකාරයේ කෙනෙකුද යන්න ඔබ තේරුම් ගත යුතුය.

මෙම රාමුව කුඩා ඔබට වැදගත් වන්නේ එතැනදීය. නමුත් මෙය හුදෙක් පියවර මාලාවක් පමණක් නොවේ. එය නිසි මානසිකත්වයක්, මූල්‍ය පුරුදු සහ අවසානයේ වටිනා ජීවන රටාවකි. මෙම බලගතු රාමුව විවෘත කර බොහෝ වැඩිහිටියන්ට තම කුඩා අවධියේ සිටම ගිලිහී ගිය සැබෑ ජීවිත කුසලතා විශ්වාසයෙන් ඉගෙන ගනිමු.

B = BUDGET අයවැය

A = ACT ක්‍රියාත්මක වීම

G = GROW වර්ධනය

## අයවැය BUDGET

### අනාගතය සමඟ ඔබේ පළමු ගනුදෙනුව

අයවැයක් සකස් කිරීම යනු ඔබ සතුව මුදල් කොපමණක් තිබෙනවාද යන්න ලියා තැබීම හෝ බෙදා වෙන් කිරීම පමණක් නොවේ. එයින් අදහස් කරන්නේ ඔබට අවශ්‍ය ජීවිතය සහ ඔබ අද දවසේ වේ වෙනුවෙන් කරන ක්‍රියාවන් එම දැක්මට ගැලපෙනවාද යන්න පිළිබඳව තීරණයක් ගැනීමයි.



අයවැයක් නිර්මාණය කරන විට, ඔබ දේවල් තුනක් කරමින් සිටී..

- ⭐ ඔබ මෙහිදී සැබෑ යථාර්ථයට මුහුණ දෙයි. ඔබට කොපමණ තිබේද, ඔබ ණය වී ඇති දේ සහ ඔබට ඇත්තෙන්ම අවශ්‍ය දේ ඔබ හොඳින් දනී. එය ලෝකයේ දුර්ලභ කුසලතාවන්ගෙන් එකක් වන ස්වයං-අවංකභාවය ගොඩනගයි.



Personal Use Only. Distribution Prohibited

## 15 කොටස

# ප්‍රගතිය සහ සාර්ථකත්වය මැන බැලීම
# Tracking Progress & Measuring Success

ව්‍යාපාරයක් ආරම්භ කිරීම උද්යෝගිමත් දෙයක් වන නමුත් ඔබේ ව්‍යාපාරය කෙතරම් හොඳින් සිදු වේද යන්න දැන ගැනීම ඉතා වැදගත් වේ. ඔබේ ව්‍යාපාරය දිනෙන් දින, සතියෙන් සතිය, මාසයෙන් මාසය, කාර්තුවෙන් කාර්තුව, වාර්ෂිකව කෙතරම් ඉදිරියට ගොස් ඇතිද සහ යම් පසුබෑමක් ඇතිද යන්න දත්ත සමඟ අවබෝධ කර ගැනීම ඔබේ ඉදිරි පියවර ගැනීම සඳහා රුකුලක් වේ. එමෙන්ම ඒ හරහා ඔබේ ව්‍යාපාරය බංකොලොත් වීමට ඇති සම්භාවිතාව අඩු කර ගත හැකිය. ප්‍රගතිය නිරීක්ෂණය කිරීම යනු ඔබේ විකුණුම්, ගනුදෙනුකරුවන් සහ ඔබ කොපමණ මුදලක් උපයනවාද මෙන්ම කොපමණක් වියදම් කරනවාද යන්න පිළිබඳව විමසිල්ලෙන් සිටීමයි. සාර්ථකත්වය මැනීම යනු ඔබේ ව්‍යාපාරය වඩාත් යහපත් කර ගැනීමට දේවල් ක්‍රියාත්මක වන ආකාරය අවබෝධ කර ගැනීම සහ යමක් නිවැරදි කිරීමට අවශ්‍ය නම්, ඒ දේවල් තේරුම් ගැනීමයි .

EXAMPLE

### වැදගත් නිදසුනක්

ඔබ ව්‍යාපාරය ලෙස කුඩා කප් කේක් විකුණන බව සිතන්න. ඔබ පුරුද්දක් ලෙස කිසිවක් ලියා තබා කටයුතු නොකරයි. යම් කුඩා ලාභයක් ඇති බව හැඟෙන නමුදු එය මුදලින් කොපමණක්ද ? ප්‍රතිශතයක් ලෙස කොපමණක්ද සහ ඉදිරි මාසයේදී එය කොපමණ ප්‍රමාණයකින් ඉහල දැමිය යුතුද යන දේ පිළිබඳ ඔබට හරි අදහසක් නොමැති නම් ව්‍යාපාරය හදිස්සියේ කඩා වැටීමට ඉඩ ඇති අතර එය භයානක තත්වයකි.

දිනක මුළු විකුණුම් - ........................................

−

දිනක මුළු වියදම්- ........................................

=

දිනක ශුද්ධ ලාභය - ........................................



Personal Use Only. Distribution Prohibited

18 කොටස

# ආපසු දීමේ බලය

## The Power of Giving Back

KINDNESS

**මෙය කිසිවිටෙකත් අමතක නොකරන්න**

ඔබ ව්‍යාපාරිකයෙක් වී දිනෙක සාර්ථක වනු ඇත. නමුත් සාර්ථකත්වය යන්නට හරි නිර්වචනයක් නොමැති නිසාවෙන් ඔබ කාට සාපේක්ෂව කුමන තලයක ධනවතෙකු වේද යන්න කිව නොහැකිය. ඒ කෙසේ වෙතත් ඔබේ ආදායම් වලින් කොටසක් සෑම විටම තම සමාජයට අරුතක් ඇති ලෙස නැවත ලබා දීමට උත්සහ කරන්න. ඇතැම් විට ඔබේ සමාජයට නැවත ලබා දීම හිරු එළිය එකිනෙකා හා බෙදා ගැනීමක් වැනිය. සෑම කෙනෙකුටම ඒ හරහා උණුසුමක් මෙන්ම සතුටක් දැනේ. ඔබ අන් අයට උපකාර කරන්නට වන විට, ඔබ කාරුණික වීම පමණක් සිදු නොවේ. එය ඔබ ඔබේ අසල්වැසි ප්‍රදේශය හෝ පාසල සෑම කෙනෙකුටම වඩා යහපත් ස්ථානයක් බවට පත් කරයි. ඔබ ව්‍යාපාරය තරමටම ඔවුන් ගැන සැලකිලිමත් වන බව එය මිනිසුන්ට පෙන්වයි.

> "ධන කුවේරයෙකු වීම නොව සුන්දර මිනිසෙකු වීම වඩා ආශ්චර්යයක් වනු ඇත."

මේ ගැන සිතන්න.. ඔබේ මිතුරාට ඔහුගේ දිවා ආහාරය අමතක වූවා නම්, ඔබට ඔබේ දේ ඔහු හා බෙදා ගැනීමට අවශ්‍ය නැද්ද? මෙලෙසම ආපසු ලබා දීමද එකම ආකාරයකින් ක්‍රියා කරයි. ඔබ ලෙමනේඩ් ස්ටෑන්ඩ් එකක් පවත්වාගෙන යන බව සිතන්න. නමුත් එය මිලදී ගැනීමට නොහැකි වීදි දරුවන්ට නොමිලේ කෝප්පයක් ලබා දීමට කටයුතු කරන්න. එම සරල කරුණාවන්ත ක්‍රියාව යමෙකුගේ දවස විශිෂ්ඨ බවට පත් කළ හැකි අතර අන් අය ද කරුණාව පැතිරවීම වෙත දිරිමත් කළ හැකිය.

Personal Use Only. Distribution Prohibited

## ඉවසීමේ වැදගත්කම

සමහර විට වඩාත් නිවැරදි තීරණය වන්නේ තවදුරටත් ඉවසීමෙන් බලා සිටීමයි. විශේෂ දෙයක් සඳහා ඔබේ මුදල් ඉතිරි කිරීම සඳහා ඉවසීම නිසැකවම අවශ්‍ය වේ. නමුත් එම කාලය ඉතා වටිනවා. උදාහරණයක් ලෙස, ඔබට අලුත් බයිසිකලයක් මිලදී ගැනීමට අවශ්‍ය නම්, ඒ සඳහා ප්‍රමාණවත් මුදලක් ඉතිරි කර ගන්නා තෙක් රැඳී සිටින්න. එයින් ඔබට අනෙකුත් වැඩ කටයුතු සඳහා මුදල් හිඟ නොවනු ඇත. එමෙන්ම ඔබේ තීරණ පිළිබඳ පසුව පසුතැවිලි නොවීමටද එය උපකාරී වනු ඇත.

> "ඥානවන්ත වියදම් කරන්නන් ඔවුන්ගේ විකල්පයන් නිතර සංසන්දනය කරති."

## වැරදි වලින් ඉගෙන ගන්න

හැමෝම වැරදි කරනවා.. ඔව් ඒක හරි ! ඔබ යම් දෙයක් මිලදී ගෙන එය හොඳ තේරීමක් නොවන බව පසුව වටහා ගත්තේ නම් - එම අත්දැකීමෙන් ඔබට ඉගෙන ගත හැකි දේ ගැන සිතන්න. ඒ හරහා ඇතැම් විට ඊළඟ වතාවේ, ඔබ විකල්ප සංසන්දනය කිරීමට වැඩි කාලයක් ගත කරනු ඇත. නැතහොත් වඩා හොඳ දෙයක් මිලදී ගැනීම සඳහා තවත් මුදල් ඉතිරි කිරීමට පෙළඹෙනු ඇත.

> "ඔබ අතින් වැරදි සිදු නොවන්නේ නම් එහි අර්ථය ඔබ උත්සහ නොකරන බවය.."

## ඔබේම නීති සකස් කර ගන්න

ඥානාන්විතව වියදම් කිරීමේ තීරණ ගැනීමට උපකාරයක් ලෙස ඔබටම අවේනික නීති කිහිපයක් සකසන්න. නිදසුනක් වශයෙන්, සෑම විටෙකම ඔබට ලැබෙන මුදලින් 10%ක් ඉතිරි කර ගැනීමට නීතියක් සකස් කර ගත හැකිය. තවද ඔබ සතුව දැනට ඇති මුදලින් පමණක් නව සෙල්ලම් බඩු මිලදී ගන්න. ඔබට ලැබීමට නියමිත මුදල් ඒ සඳහා වෙන් නොකරන්න. එමෙන්ම විශාල දේවල් මිලදී ගැනීමට පෙර දෙමාපියන් හෝ නැණවත් මිතුරෙකු සමඟ ඒ පිළිබඳ සාකච්ඡා කරන්න.

Personal Use Only. Distribution Prohibited